**වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල - 2023**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළකරනු ලැබේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 21 වගන්තිය ප්‍රකාරව සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සමන්විත විය යුතු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන් ඉදිරිපත් කර නොතිබුණි. තවද ලෙජර් ගිණුම් පවත්වා නොගෙන හා උපචිත පදනම අනුගමනය කිරීමෙන් තොරව මුදල් පදනම මත ආදායම් හා වියදම් ගිණුමක් සහ ශේෂ පත්‍රයක් පමණක් පිළියෙල කර තිබුණි. | ශුද්ධ වත්කම් පිළිබඳ ප්‍රකාශය අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල සඳහා මුදල් පදනමින් ගිණුම් පිළියෙල කර තිබූ අතර 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව 2024 සිට ගිණුම් කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කරමින් සිටින බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කර අරමුදලේ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වලට අදාළ ලෙජර් ගිණුම් පවත්වා ඒ ආශ්‍රයෙන් මූල්‍ය ප්‍රකාශන කට්ටලය සකස්කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 7 වගන්තිය ප්‍රකාරව උසාවි දඩ මුදල් නියම වන අවස්ථාවේදී ආදායම් හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණු අතර ගෙවිය යුතු ත්‍යාග මුදල් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු අවස්ථාවේදී ද එය හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ලෙස පිළිවෙලින් රු. 2,016,922 ක් හා රු.1,353,000 ක් මුදල් පදනමින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. | උසාවිවල පවත්වාගෙන යන නඩු පිළිබඳ තොරතුරු රැස්කර පවත්වාගෙන යාමට කටයුතු කරමි. | ප්‍රමිතීන් ප්‍රකාරව ගිණුම් වර්ෂයට අදාළ උසාවි දඩ මුදල් ආදායම හා ත්‍යාග මුදල් වියදම නිවැරදිව හඳුනාගෙන උපචිත පදනමට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ත්‍යාග අරමුදල වෙත 2014 සිට සමාලෝචිත වර්ෂය දක්වා බැර කරන ලද දඩ මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන විට ත්‍යාග සඳහා ගෙවිය යුතු රු.2,878,616 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර මෙය ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට ද කටයුතු කර නොතිබුණි. උසාවි දඩ නියම කිරීමේදී එය නිවැරදිව හඳුනාගෙන ලැබිය යුතු ආදායම් ලෙස ද, නොගෙවූ ත්‍යාග මුදල් ගෙවිය යුතු මුදල ලෙස ද ගිණුම් වල පෙන්වීමට හැකිවන පරිදි ස්වකීය ආදායම් ,වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ පොත්පත් පවත්වාගෙන ගොස් නොතිබුණි. | විගණන නිරීක්ෂණය පරිදි ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාමට කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 මැයි 09 දිනැති අංක 2018/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මඟින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 31 (ඊ) වගන්තිය අනුව පිහිටුවන ලද වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලින් ත්‍යාග ගෙවීම් කිරීමේ මාර්ගෝපදේශ හා උපමාන | | | |
| (i) | 1 වන මාර්ගෝපදේශය | ත්‍යාග අරමුදල වෙත 2014 සිට 2023 වර්ෂය දක්වා බැර කරන ලද රු.15,231,732 ක දඩ මුදලින් ත්‍යාග සඳහා ගෙවිය යුතු මුදල රු.7,615,866 ක් වුවද, එයින් රු.2,878,616ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. අදාල නඩු පිළිබඳ විස්තර හා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය පිළිබඳ | ත්‍යාග ලබාදීම සඳහා පොලිස් ස්ථාන මඟින් නිලධාරීන්ගේ තොරතුරු එවිය යුතු අතර එසේ තොරතුරු එවා නොමැති ත්‍යාග ගෙවීමට හැකියාවක් නොමැත. මෙම රු. මි. 2.8 තුළ පොලිස් නිලධාරීන්ට හා දෙපාර්තමේන්තු නිලධාරීන්ට ගෙවිය යුතු ත්‍යාග මුදල් පමණක් පවතී. | පොලිස් නිලධාරීන්ගේ නාම ලේඛන නියමිත වේලාවට ලබාගැනීමට අවශ්‍ය වැඩපිළිවලක් සකස් කර ගෙවිය යුතු ත්‍යාග මුදල් අප්‍රමාදව ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | විස්තර නොතිබීම මේ සඳහා හේතු වී තිබුණි. | | |
| (ii) | 3(iii) වගන්තිය | ත්‍යාග ගෙවීමට පෙර එයට අදාළ නිලධාරීන්ගේ නාම ලේඛනය අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතික කළයුතු වුවද, පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිගෙන් ලැබෙන තොරතුරු මත පමණක් පදනම් වී ත්‍යාග ගෙවීම් සිදුකර තිබුණි. | ඉදිරියේදී ගෙවීම් කටයුතු සිදු කිරීමේදී පොලිස් ස්ථානාධිපතිවරු විසින් ත්‍යාග හිමි නිලධාරීන්ගේ නාම ලේඛනය අත්සන් කර එවූ පසු සහතික කිරීම සඳහා මා වෙත යොමු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. ගෙවීම් කරන ලද වවුචර්පත් ගෙවීම් හිමි නිලධාරීන්ගේ නාම ලේඛන ද සමඟ ගිණුම් අංශයේ ගොණු ගත කර ඇත. | මාර්ගෝපදේශ හා උපමාන අනුව ත්‍යාග ගෙවීමට පෙර එයට අදාළ නිලධාරීන්ගේ නාම ලේඛනය අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතික කිරීමට කටයුතු කළයුතුය. |
| (iii) | 5(i) වගන්තිය | ත්‍යාග සඳහා ගෙවීම් අර්ධ වාර්ෂිකව සිදුකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 07 කදී එකතුව රු. 1,353,000 ක ත්‍යාග ගෙවීම් සිදුකර තිබුණු අතර ඊට හේතු ඉදිරිපත් නොවීය. | අදාළ තොරතුරු අධිකරණ වලින් හා පොලිස් ස්ථාන මඟින් රැස්කිරීම සිදුකළ යුතුව පවතී. වෙරළ සංරක්ෂණ පනත ප්‍රකාරව උසාවිවල පවත්වා ගෙන යන නඩු පිළිබඳව සහ එම නඩු වලට සහභාගී වූ නිලධාරීන් පිළිබඳ තොරතුරු රැස් කර පවත්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | නඩු වලට සහභාගී වූ නිලධාරීන් පිළිබඳ තොරතුරු රැස් කර පවත්වා ගනිමින් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2) (ඇ) හා (ඉ) ඡේද | ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුළත අරමුදල පිළිබඳ කාර්යසාධන වාර්තාවක් සකස් කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත යොමුකිරීමටත්, වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටත් ආරම්භයේ සිටම කටයුතු කර නොතිබුණි. | වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල සඳහා පිළියෙල කරන ලද 2023 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව 2024.04.02 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව දන්වන අතර, පිටපතක් විගණකාධිපති වෙත යොමු කිරීමට අතපසු වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා සකස්කර අදාළ අංශ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 337,081 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 346,095 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,014 ක වර්ධනයක් නිරීක්ෂණය විය. අධිකරණවලින් ලබාගත් දඩ මුදල්වලින් ත්‍යාග ගෙවීමේ ප්‍රතිශතය සියයට 12 කින් අඩුවී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොලිස් ස්ථාන 31 කින් ලබාගත් විස්තර අනුව 2014 සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ අධිකරණවලින් ලැබිය යුතුව තිබූ රු. 10,062,500 ක් ලබාගැනීමට කටයුතු කර නොතිබීමෙන් දිරිගැන්වීම සඳහා ගෙවිය යුතු ත්‍යාග මුදල රු.5,031,250 ක් හා ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු සියයට 40 ක් වන රු. 4,025,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් බැර කිරීමට නොහැකි වී තිබුණි. | පොලිස් නිලධාරීන්ගෙන් ලැබෙන තොරතුරු මත අදාළ අධිකරණවලින් මුදල් එවා නොමැති අවස්ථාවල දී එම මුදල් එවීමට කටයුතු කරන ලෙස අධිකරණ වෙත නීති අංශය මඟින් ලිපි යොමු කර ඇත. අධිකරණ විසින් අප වෙත දන්වා ඇත්තේ දඩ මුදල් පළාත් සභාව වෙත යොමුකර ඇති බැවින් ඒවා නැවත ගෙන්වා අප වෙත යොමු කරන බවයි. සමන්තුරේ අධිකරණය විසින් කොටස් වශයෙන් ගෙවිය යුතු දඩ මුදල් වලින් යම් මුදල් ප්‍රමාණයක් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත් ඉතිරි කොටස් සඳහා එවිය යුතු මුදල එවා නොමැති බැවින් දඩ මුදල් සම්පූර්ණ වන තුරු ගෙවීම් සිදු කළ නොහැකි වී ඇත. සමන්තුරේ අධිකරණය දන්වා ඇත්තේ ද අදාළ මුදල් පළාත් සභාව වෙත යොමුකර ඇති අතර, පළාත් සභාවෙන් ගෙන්වා නැවත මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සලස්වන ලෙසයි. | මහේස්ත්‍රාත් අධිකරණ හා පොලිස් දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු හුවමාරු කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ත්‍යාග අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුම අනුව 2016 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය දක්වා කාලය තුළ අරමුදලෙන් කළ යුතු ගෙවීම් නිසි වේලාවට සිදු නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි මුදල් ශේෂය රු. මිලියන 2.8 අධික විය. | 2023.12.31 දිනට ත්‍යාග අරමුදලේ ශේෂය වන රු.මි. 2.8 තුළ ඇත්තේ පොලිස් නිලධාරීන්ට හා දෙපාර්තමේන්තු නිලධාරීන්ට ගෙවිය යුතු ත්‍යාග මුදල් පමණි. | පොලිස් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ගෙවිය යුතු ත්‍යාග මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අධිකරණ මඟින් එවා ඇති දඩ මුදල් පිළිබඳව හා පොලිස් ස්ථානාධිපතිවරුන් විසින් එවා ඇති ත්‍යාග මුදල් පිළිබඳව තොරතුරු ඇතුලත් ලේඛන වල සඳහන් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ලැබීම් හා ගෙවීම් ගිණුම් සමඟ නොසැසඳීම, ලේඛන යාවත්කාලීන කර නොතිබීම, ගෙවීම් පිළිබඳ විස්තර පොදු තැන්පතු ලේඛනයේ සටහන් කර යාවත්කාලීන වී නොතිබීම යනාදී දෝෂ හේතුවෙන් ලැබීම් හා ගෙවීම් සම්බන්ධ අභ්‍යන්තර පාලනය සතුටුදායක නොවීය. | වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල ගෙවීම් සඳහා නම්කර ඇති නිලධාරීන්ගේ නාම ලේඛනයේ හා පොලිස් නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් කරන ලේඛනයේ සටහන් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. | ලේඛන වල නිවැරදි තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන කිරීමටත්, ගෙවීම් පිළිබඳ විස්තර පොදු තැන්පතු ලේඛනයේ සටහන් කිරීමටත්, පොදු තැන්පතු ලේඛනයේ සටහන් කර ඇති තොරතුරු ලැබීම් හා ගෙවීම් ලේඛනයේ ඇතුළත් කර ලැබීම් හා ගෙවීම් සම්බන්ධ අභ්‍යන්තර පාලනයක් ඇති කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) | වරදකරුවන්ගෙන් අධිකරණ විසින් අයකරගනු ලබන සියළුම දඩ මුදල්, අරමුදල වෙත අයකර ගැනීමටත්, එසේ අරමුදලට බැරවන මුදල් අදාළ පාර්ශව වෙත ත්‍යාග වශයෙන් වෙන්කර ලබාදීම සඳහාත් මහේස්ත්‍රාත් අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අතර තොරතුරු හුවමාරු කිරීමේ නිසි ක්‍රමවේදයක් නොතිබුණි. මේ හේතුවෙන් අධිකරණවලින් ලැබිය යුතු දඩ මුදල් සහ ත්‍යාග ලබා දිය යුතු පුද්ගලයින් පහසුවෙන් හා කඩිනමින් හඳුනාගෙන අදාළ තොරතුරු ලබාගැනීමටත්, භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු සියයට 40 ක දඩ මුදල් ප්‍රමාණය නිසි වේලාවට ප්‍රේෂණය කිරීමට නොහැකි වී ඇති බවටත් නිරීක්ෂණය විය. | පොලිස් නිලධාරීන්ගෙන් ලැබෙන තොරතුරු මත අදාළ අධිකරණවලින් මුදල් ගෙන්වා ගැනීමට ලිපි යොමු කර ඇත. අධිකරණ විසින් අප වෙත දන්වා ඇත්තේ දඩ මුදල් පළාත් සභාව වෙත යොමුකර ඇති බැවින් ඒවා නැවත ගෙන්වා අප වෙත යොමු කරන බවය. | නඩු කටයුත්ත අවසන් වූ වහාම අධිකරණය මඟින් දඩ මුදල් ලබාගෙන ප්‍රමාදයකින් තොරව දඩ මුදල් ගෙවීම සඳහා පළාත් සභාව හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් අතර නිසි තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |